# ජාතික සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ සපයන අනගාරික ධර්මපාලතුමාගේ දස වැදෑරුම් වැඩ පිළිවෙල

**ඊ. ඩබ්ලිව්. ඒ. එච්. සී. ගුණසිංහ**
කැලණිය විශ්වවිද්‍යාලය
*hachaqu@gmail.com*

දහනමවන සියවස අගභාගයේදී පමණ ඇති වූ බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කළ අනගාරික ධර්මපාලතුමාගේ භූමිකාව එයට පමණක් සීමා නොවීය. ධර්මපාලතුමාගේ ප්‍රධාන ඉලක්කයක් වූයේ බටහිර ගැති මානසිකත්වයෙන් මිදුණු, දියුණු ස්වරාජ්‍යයක් බවට ලංකාව පත්කර ගැනීමයි. එය සංකල්පයකට පමණක් සීමා කර නොගත් එතුමා එයට අවශ්‍ය න්‍යායික පදනමක් ඉදිරිපත් කළා පමණක් නොව ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමද සිදු කළ බවට සාධක රැසකි. අනගාරික ධර්මපාලතුමා විසින් ජාතික සංවර්ධනය උදෙසා ඉදිරිපත් කරන ලද ප්‍රායෝගික වැඩ පිළිවෙල පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනයේදී, අධ්‍යයන ක්‍රමවේදය වූයේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. අනගාරික ධර්මපාලතුමාගේ සටහන්වලට අනුව 'දියුණුවීමට නම්, ස්වයංපෝෂිත වීමට නම්' යනුවෙන් එතුමා විසින් දක්වන ලද දස වැදෑරුම් වැඩපිළිවෙලක් හඳුනාගත හැකිය. එය මෙසේය.

- අපගේ ජාතිය ගලවාගැනීමේ ඒකායන මාර්ගය අධ්‍යාපනයයි.
- වසරකට එක් සතියක් හෝ අනවශ්‍ය සුඛෝපභෝගී භාණ්ඩ හා ආහාරපාන පරිහරණය නොකොට ඉතිරි කරගත් මුදල ජාතික අධ්‍යාපන අරමුදලකට බැර කොට, එම මුදල් කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනයේ වර්ධනයට යොදාගත යුතුය.
- සිංහල තරුණයන් ඇමෙරිකාව, ජපානය වැනි රටවලට ශිෂ්‍යත්ව මගින් යවා තාක්ෂණය, කෘෂිකර්මය ආදී විෂයයන් පිළිබඳ දැනුමක් ලබා දී ජාතිය ගොඩනැගීමේ කාර්යය ඇරඹිය යුතුය.
- විදේශීය භාණ්ඩ පරිහරණයෙන් සහ පාරිභෝජනයෙන් වැළකිය යුතුය.
- රට තුළ නිෂ්පාදනය කළ හැකි සෑම භාණ්ඩයක්ම නිපදවා පරිහරණයට ගත යුතුය.
- රට තුළ නැවත කර්මාන්ත ආරම්භ කිරීමෙන් ධනය හා රැකියා උත්පාදනය වැඩි කළ යුතුය.
- ධන උත්පාදනය, සංසරණය හා හුවමාරු කිරීමේ මූලික සිද්ධාන්ත පිළිබඳ අවබෝධයක් ලබාදිය යුතුය.
- ස්වභාවික සම්පත් විශේෂයෙන් වන සම්පත් රැකගැනීමට මෙන්ම වැඩිදියුණු කිරීමට ක්‍රම සහ විධි ඇති කළ යුතුය.

- දක්ෂ, විශේෂඥ දැනුම ඇති පරිපාලන නිලධාරීන් පමණක් වගකිවයුතු උසස් තනතුරුවලට පත් කළ යුතුය.
- විදේශීය භාෂා ඥානය ලබාගැනීම ජාතික අවශ්‍යතාවක් බැවින් භාෂා දැනුම ලබාගැනීමේ වැඩ පිළිවෙලක් සැකසිය යුතුය,

මෙමගින් රටේ අධ්‍යාපනය, ආර්ථිකය, කර්මාන්ත, රාජ්‍ය සේවය ආදී අංශ ගණනාවක් ශක්තිමත් කිරීම පිළිබඳ පමණක් නොව ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳවද විශේෂ සැලකිල්ලක් ධර්මපාලතුමා දක්වා තිබේ. එසේම විදේශ භාෂා ඉගැන්වීමේ වැදගත්කම අවධාරණය කරන ධර්මපාලතුමා අනාගත ගෝලීයකරණ ලෝකයේ ලංකාවට හිමි තැන තහවුරු කරගැනීමට එය ප්‍රබල සාධකයක් වන බව දූරදර්ශීව කල්පනා කළ බව පෙනේ. මෙම වැඩපිළිවෙල ප්‍රායෝගික කිරීමට ධර්මපාලතුමා හැකි පමණින් කටයුතු කළ බව එතුමාගේ මූලිකත්වයෙන් සිදුකරන ලද පාසල් ආරම්භ කිරීම, සිංහල තරුණයන්ට විදෙස් ශිෂ්‍යත්ව ලබාදීම, ස්වදේශ කර්මාන්ත ආරම්භ කිරීම ආදියෙන් පැහැදිලි වේ. සමකාලීන සමාජයට මෙන්ම වර්තමානයටද එක සේ ගලපා ගත හැකි ධර්මපාලතුමාගේ දස වැදැරුම් ප්‍රායෝගික වැඩපිළිවෙල වඩාත් සාර්ථකව ක්‍රියාවට නැංවීමේ වගකීම වර්තමාන ලාංකික ප්‍රජාවට භාර වී ඇත.

මුඛ්‍ය පද : අනගාරික ධර්මපාලතුමා, ධර්මපාල චින්තනය, ධර්මපාලතුමාගේ සය වැදැරුම් වැඩපිළිවෙල, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති